LIBRARY OF PARLIAMENT
15 NOV 1984
SRI JAYAWARDENEPURA

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 3 දරන
# තේ පාලන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 3 දරන තේ පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 82/80

## 1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 3 දරන තේ පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1957 අංක 51 දරන තේ පාලන පනතේ දීර්ඝ නාමයෙහි, "සන්තකයේ තබා ගැනීම, විකිණීම" යන වචන වෙනුවට "සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රවාහනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1957 අංක 51 දරන තේ පාලන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසේ ශීර්ෂ පාඨයෙහි "සන්තකයේ තබා ගැනීම, විකිණීම" යන වචන වෙනුවට, "සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රවාහනය කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂ පාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසේ ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "හෝ එවැනි අවසර ලත් වෙළෙන්දකු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු" යන වචන වෙනුවට "හෝ ඒ අවසර ලත් වෙළෙන්දා වෙනුවෙන් ක්‍රියා කිරීමට විධිමත්ව ලියවිල්ලකින් අවසර දෙනු ලැබූ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන සහ (3) වන උපවගන්තිවල "හෝ එවැනි අවසර ලත් වෙළෙන්දකු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු" යන වචන වෙනුවට "හෝ ඒ අවසර ලත් වෙළෙන්දා වෙනුවෙන් ක්‍රියා කිරීමට විධිමත්ව ලියවිල්ලකින් අවසර දෙනු ලැබූ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 16අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතුය :— — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 16අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"තේ ප්‍රවාහනය කිරීම.

16අ. (1) සාදන ලද තේ පිළිබඳ අවසරලත් වෙළෙන්දකු හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකයකු හෝ, ඒ අවසර ලත් වෙළෙන්දා හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට විධිමත්ව ලියවිල්ලකින් අවසර දෙනු ලැබූ තැනැත්තකු නොවන කවර වූ හෝ තැනැත්තකු විසින් නියමිත ප්‍රමාණයට වැඩි යම් සාදන ලද තේ ප්‍රමාණයක්, එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ප්‍රවාහනය කිරීම හෝ ප්‍රවාහනය කිරීමට සැලැස්වීම නොකළ යුතු ය :

2—ඒ 66527—11,750 (82/11)

එසේ වුවද, ලියාපදිංචි කළ නිෂ්පාදකයකු නො වන, ලියාපදිංචි කළ වත්තක හෝ කුඩා වත්තක ලියාපදිංචි කළ අයිතිකරු විසින්, ඒ වත්තෙහි හෝ කුඩා වත්තෙහි නිෂ්පාදිත අමු තේ දළුවලින් ලියා පදිංචි කළ නිෂ්පාදකයකු විසින් ඔහුට නිෂ්පාදනය කර දෙනු ලැබූ යම් සාදන ලද තේ ප්‍රමාණයක් ප්‍රවාහනය කරනු ලැබීම හෝ ප්‍රවාහනය කරනු ලැබී මට සැලැස්වීම මේ උපවගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවල යම් විධිවිධානයකින් තහනම් කරනු ලබන ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) අමු තේ දළු පිළිබඳ අවසර ලත් වෙළෙන් දකු හෝ ලියාපදිංචි කළ වත්තක හෝ කුඩා වත් තක ලියාපදිංචි කළ අයිතිකරුවකු හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකයකු හෝ ඒ අවසර ලත් වෙළෙන්ද, ලියාපදිංචි කළ අයිතිකරු හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකයා වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු නොවන කවර වූ හෝ තැනැත්තකු විසින් යම් අමු තේ දළු ප්‍රමාණයක් ප්‍රවාහනය කරනු ලැබීම හෝ ප්‍රවාහනය කරනු ලැබීමට සැලැස්වීම හෝ නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල "හෝ වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු" යන වචන වෙනුවට "හෝ වෙනුවෙන් ක්‍රියා කිරීමට විධිමත්ව ලියවිල්ල කින් අවසර දෙනු ලැබූ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල "හෝ වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකු" යන වචන වෙනුවට "හෝ වෙනුවෙන් ක්‍රියා කිරීමට විධිමත්ව ලියවිල්ල කින් අවසර දෙනු ලැබූ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ පනත යටතේ වරදට දඬුවම් කිරීම.

45. (1) මේ පනත යටතේ යම් වරදකට වරද කරු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, ස්වකීය සාමාන්‍ය අධි කරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා මහේස්ත්‍රාත් වරයකු විසින් නියම කරනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවන්නේ වුව ද, ඒ නොතකා රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුද්දක කාලයක් නොඉක්මවන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබූ විට, මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දඩුවමකට අමතරව ඔහු විසින්—

(අ) ඒ වරද 15 වන වගන්තිය, 16 වන වගන්තිය, 16අ වගන්තිය, 19 වන වගන්තිය, 20 වන වගන්තිය, 43 වන වගන්තිය හෝ 44 වන වගන්තිය, කඩ කිරීම සම්බන්ධ වරදක් වන අවස්ථාවක, වරද සිදු කරන ලද්දේ යම් සාදන ලද තේ හෝ අමු තේ දළු සම්බන්ධයෙන් ද, ඒ සාදන ලද තේ හෝ අමු තේ දළු රාජසන්තක කරන ලෙස අණ කිරීම ; සහ

(ආ) ඒ වරද 16අ වගන්තිය කඩ කිරීම සම්බන්ධ වරදක් වන අවස්ථාවක, සාදන ලද තේ හෝ අමු තේ දළු ප්‍රවාහනය කරන ලද්දේ හෝ ප්‍රවාහනය කිරීමට උත්සාහ කරන ලද්දේ යම් වාහනයක ද, ඒ වාහනය රාජසන්තක කරන ලෙස අණ කිරීම

කරනු ලැබිය හැකිය. ”.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ වරද සමථයට පත් කිරීම. 48. අවස්ථානුගත කරුණු අනුව සාධාරණ සහ යුක්ති සහගත යයි තමා විසින් සලකනු ලබන අවස්ථාවක—

(i) වරද සිදු කරන ලද්දේ යම් සාදන ලද තේ හෝ අමු තේ දළු ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ ප්‍රමාණයේ (කොමසාරිස් විසින් තීරණය කරනු ලබන පරිදි) වෙළෙඳ වටිනාකම මෙන් දෙගුණයක් හා සමාන මුදලක් වරදකරුගෙන් පිළිගැනීමෙන් 15 වන වගන්තිය, 16 වන වගන්තිය, 16අ වගන්තිය, 19 වන වගන්තිය, 20 වන වගන්තිය, 43 වන වගන්තිය සහ 44 වන වගන්තිය යටතේ කරන ලද වැරදි සම්බන්ධයෙන් ; සහ

(ii) රුපියල් දස දහසක් නොඉක්මවන මුදලක් වරදකරුගෙන් පිළිගැනීමෙන් (i) වන ඡේදයෙහි සඳහන් වරදවල් නොවන යම් වරදක් සම්බන්ධයෙන්

මේ පනත යටතේ වූ යම් වරදක් කොමසාරිස් විසින් සමථයකට පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, යම් වරදක් සම්බන්ධයෙන් ඒ වන විට යම් අධිකරණයක නඩුවක් පවරා ඇත්තේ නම්, මහේස්ත්‍රාත්වරයාගේ අනුමතය ඇතිව පමණක් කොමසාරිස් විසින් ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "නියමිත දිනය" යන යෙදුමෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'"කොමසාරිස්" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතින් තේ කොමසාරිස් වශයෙන් හෝ එසේ ක්‍රියා කිරීමට පත් කරන ලද තැනැත්තා අදහස් වේ.'.